**සමූපකාර සංවර්ධන අරමුදල - 2018**

**-------------------------------------**

**තත්ත්වාගණනය කළ මතය**

**-----------------------------**

සමූපකාර සංවර්ධන අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**-------------------------------------------**

### 1.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

**----------------------------------------------------------------------------------------------------**

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 1හි 21 ඡේදය ප්‍රකාරව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන සමග ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනයක් ඉදිරිපත් කර නොතිබුණි. | | ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 1 හි 70 ඡේදය ප්‍රකාරව මුල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වත්කම් ද්‍රවශීලතා අනුපිළිවෙලට පෙළගස්වා නොතිබුණි. | ප්‍රවර්ථන වසරේ සිට නිවැරදි කිරීමට කටයුතු කරමි. | ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 2 ප්‍රකාරව, සමාලෝචිත වර්ෂයේ මුදල් ප්‍රවාහයට බලපෑමක් නොවූ පෙර වර්ෂයේ සිදුවූ වැරදි නිවැරදි කිරීම් රු.302,906 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණි. | ප්‍රමාද දෝෂයකින් සමුච්චිත අතිරික්තය වෙනස මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ දක්වා ඇති අතර ප්‍රවර්ථන වසරේ සිට නිවැරදිව ඉදිරිපත් කිරිමට කටයුතු කරමි. | ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 2 හි 40 ඡේදය ප්‍රකාරව රු.13,369,418 ක් වූ ආයෝජන මත පොළි ලැබීම් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන මුදල් ප්‍රවාහයක් ලෙස වෙනම හෙළිදරව් කර නොතිබුණි. තවද අරමුදලේ ස්ථාවර තැන්පත් ආයෝජනය රු.91,079,852 ක් වුවද, එය ආයෝජන කටයුතු වලින් ලද මුදල් ප්‍රවාහය ලෙස රු.56,000,000 ක් හා මෙහෙයුම් ක්‍රියාකාරිත්වයෙන් ලද මුදල් ප්‍රවාහය ලෙස රු.35,079,852 ක් දක්වා තිබුණි. | ප්‍රවර්ථන වසරේ සිට ආයෝජන පොලී ලැබීම් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ වෙනමම ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායි ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් රු.4,755,627 ක්වූ ජංගම නොවන වත්කම් අයිතම් 08 ක් සම්පූර්ණයෙන්ම ක්ෂය කර ඇතත් අරමුදල විසින් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 ප්‍රකාරව අදාල වත්කම් හඳුනා ගැනීමෙන් අනතුරුව ප්‍රත්‍යාගණනය කර ඉදිරියේදී ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කරමි. | ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

-------------------------

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අරමුදලට රාජ්‍ය බැංකුවකින් ලැබුණු ආධාර රු.4,400,000 ක් වර්ෂයේ ආධාර ලැබීමක් ලෙස හෙලිදරව් නොකර සමුපකාර දින උත්සව වියදම්වලින් අඩුකර මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | මෙම මහජන බැංකුවෙන් ලද රු. මිලියන 4.4ක මුදල 97 වන ජාත්‍යන්තර දින සමුපකාර උත්සවයේ වියදම් සඳහා ලබා දී ඇති අතර ඒ අනුව ගිණුම් සකසා ඉදිරිපත් කර ඇත. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2008 වර්ෂයේදි බඳවා ගෙන තිබුණ නිලධාරියෙකු වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා රු. 126,700 ක පාරිතෝෂිත වෙන් කිරීම් සිදුකර නොතිබුණි. | ප්‍රවර්ථන වසරේ සිට පාරිතෝෂික වෙන් කිරීම් කටයුතු සිදු කර ගිණුම් ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | පාරිතෝෂික වෙන් කිරීම් ගිණුම්ගත කළ යුතුය. |

## 1.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්

-----------------------------

| **විෂයය** | **මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු.** | **අනුරූපී වාර්තා අනුව වටිනාකම රු.** | **වෙනස රු.** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|---|---|
| ලැබිය යුතු සමූපකාර සමිති ණය පොලී | 7,907,686 | 7,014,825 | 892,861 | විස්තර සොයා ගැනීමේ අපහසුතාවය මත නිරවුල් කිරීමට නොහැකි වී ඇත. වෙනස්කම් පිළිබඳ සමිති කැඳවා එකඟතාවය ලබා ගැනීමට කටයුතු කරමින් ඇත. | වෙනස හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කළ යුතුයි. |

### 1.2.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

---------------------------------------

| විෂයය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- | --- |
| | රු. | | | |
| කෘෂි අරමුදල් අතිරික්තය | 14,503,854 | ශේෂ සනාථ කිරීම් | කෘෂි අරමුදල අවසන් කිරිමේදී සමූපකාර අරමුදලට මාරු කර ඇති ශේෂයයි. | |
| සමූපකාර සමිති ණය (කෘෂි අරමුදල) | 12,860,953 | ශේෂ සනාථ කිරීම් | වසර ගණනක් පැරණි ණය ශේෂ වන අතර අදාල වත්කම් හා ක්‍රියාකාරී සමිති හඳුනා ගැනීමෙන් අනතුරුව ශේෂ සනාථන කඩිනමින් ලබා ගැනීමට කටයුතු කරමින් පවතී. | ශේෂ සනාථ ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| ණය ලබාදීම ඌව පලාත | 5,439,905 | ශේෂ සනාථ කිරීම් | ශේෂ සනාථන ලබාගෙන කඩිනමින් විගණනය සඳහා ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | |

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

---------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම,පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා  විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී  අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර,

දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් පිරිමැසුම්දායීව, කාර්යක්ෂමව සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරිබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත්“මනාලෙස සැලසුම් කරන ලද” අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ජංගම වත්කම් යටතේ දක්වා ඇති 1997 වර්ෂයේ සිට පැවත එන රු.2,666,000 ක් වූ සමුපකාර විදුහල් ණය, 2012 වර්ෂයට පෙර සිට පැවත එන රු.1,999,600 ක් වූ කාර්යසාධන අත්තිකාරම් හා රු.1,184,000 ක් වූ උසාවි වන්දි අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සමුපකාර විදුහල් ණය, හා කාර්යසාධන අත්තිකාරම් අදාල විස්තර සොයා ගැනීමේ දුෂ්කරතාවය මත නිරවුල් කිරීමට නොහැකි වී ඇති අතර විස්තර සොයා ගැනීමෙන් අනතුරුව නිරවුල් කිරීමට කටයුතු කරමි . | ණය ශේෂයන් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සී/ස කොබෙයිගනේ විවිධ සේවා සමූපකාර සමිතියේ නවීකරණ කටයුතු සඳහා 2012 වර්ෂයේදී රු.3,000,000 ක් අරමුදලින් ලබාදී තිබුණි. ණය ගිවිසුම ප්‍රකාර 2018 දෙසැම්බර් 31 දින වනවිට ණය මුදල් ගෙවා අවසන් විය යුතු වුවද 2018 දෙසැම්බර් 31 වන විටත් මෙම ණය මුදලින් රු.2,983,090 ක් හා රු.1,516,387 ක ණය පොලියක් අයවිය යුතුව පැවතුනි. ණය ගිවිසුම ප්‍රකාරව ඇප ආවරණය සඳහා ගිවිසුමකට එළඹීමට හා රක්ෂණ ආවරණයක් ලබා ගත යුතු වුවද, ගිවිසුමකට එළඹීමට රක්ෂණ ආවරණයක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම පළාත් වලින් අය විය යුතු ණය ශේෂ සඳහා පළාත් කොමසාරිස් සමුළුවලදී දිගින් දිගටම පළාත් කොමසාරිස්වරුන් දැනුවත් කර ඇති අතර ඒ අනුව කඩිනමින් මෙම ණය මුදල් අය කර ගැනීමට කටයුතු කරමින් පවතී. | ණය ශේෂයන් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 1999 හා 2000 වර්ෂවල උතුරු නැගෙනහිර පළාතේ සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත පිළිවෙලින් රු.15,000,000 ක් හා රු.4,500,000 ක ණය මුදල් ලබාදී තිබුණි. ණය මුදල් ලබාදී වසර 20 ක් ගත වී ඇතත් 2018 දෙසැම්බර් 31 දිනට ඉන් රු.14,575,000 ක හා රු.4,475,000 ක ශේෂයක් අයවීමට පැවති අතර, අයවිය යුතු ණය පොලිය රු.3,810,000 ක් විය. | | ණය ශේෂයන් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සී/ස රබර් සමූපකාර සමිති සංගමය වෙත 1987, 1989 සහ 1990 වර්ෂවලදී ලබාදුන් එකතුව රු.2,750,000 ක ණය මුදලින් 2018 දෙසැම්බර් 31 වන විට වර්ෂ 28 ක් ඉක්මවා තිබුණද, ඉන් රු.1,849,634 ක් හා එදිනට ණය පොලිය රු.147,971 ක් අයවිය යුතුව පැවතුනි. | විගණන හා කළමනාකරණ කමිටුව වෙත ඉදිරිපත් කර එහි තීරණ මත කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කරමි. | ණය ශේෂයන් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | වර්තමානයේ අක්‍රීය සමිතියක් බවට හඳුනාගෙන ඇති ශ්‍රී ලංකා කිරි නිපදවන්නන්ගේ සමූපකාර සමිති මහා සංගමයට 2002 වර්ෂයේදී රු.1,000,000 ක් ණය මුදලක් ලබාදී තිබුණු අතර, වර්ෂ 16 ගත වී ඇතත් මෙම මුදලින් කිසිදු වාරිකයක් අයකර ගෙන නොතිබුණි. 2018 දෙසැම්බර් 31 දිනට එම සංගමයෙන් රු.240,000 ක ණය පොලියක් අයවිය යුතුව පැවතුනි. | වගකීම් නිරවුල් කර කඩිනමින් ඈවර කටයුතු අවසන් කිරීමට කටයුතු කරමි. | ණය ශේෂයන් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | සමූපකාර සමිති 54 ක් වෙත ලබාදුන් රු.43,809,281 ක්වූ මුළු ණය මුදලින් 2018 දෙසැම්බර් 31 දිනට වර්ෂ 16 සිට වර්ෂ 54 ක් දක්වා වූ කාල පරාසයක අයවිය යුතුව පැවති ශේෂය රු.34,303,581 ක් විය. සමාලෝචිත වර්ෂය වන විට ඉන් ණය ගෙවීම සිදු කරන සක්‍රීය සමිති ගණන දෙකක් පමණක් විය. | ණය මුදල් නැවත සමාලෝචනය කර අරමුදල් කළමනාකරණ කමිටුවට ඉදිරිපත් කර එමගින් ලැබෙන තීරණ අනුව කටයුතු කිරීමට පියවර ගනිමි. | ණය ශේෂයන් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 188 (2) | 2011 හා 2012 වර්ෂයන්ට අදාළ එකතුව රු.300,000 ක් වූ තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත් 02 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | ප්‍රවර්තන වසරේදී කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කරමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු.19,742,511 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.27,420,879 ක් වුයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.7,678,368 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. දායක මුදල් ආදායම රු.7,508,189 කින් අඩුවීම හා මෙහෙයුම් වියදම රු.2,247,578 කින් වැඩිවීම ඉහත පිරිහීමට ප්‍රධාන ලෙස බලපා තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018 දෙසැම්බර් 31 දිනට රු.62,557,658 ක් වූ ලැබිය යුතු දායක මුදල් ශේෂයෙන් වර්ෂ 4කට වඩා පැරණි ශේෂ රු.25,944,056 ක් වූ අතර, වර්ෂ 01 ත් වර්ෂ 04 ත් අතර කාලය තුල ලැබිය යුතු ශේෂය රු.36,613,601 ක් විය.ඉන් සමුපකාර සමිති 13 කින් 2015 වර්ෂයේ සිට කිසිදු දායක මුදලක් අයවී නොතිබුණු අතර එම ශේෂය රු.24,172,353ක් විය. එසේම සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු දායක මුදල් ශේෂයෙන් රු.30,499,383 ක් එනම් සියයට 48.8 ක් සී/ස අධ්‍යාපන සේවා නියුක්තිකයන්ගේ සමුපකාර සමිතියෙන් අයවිය යුතුව පැවතුනි. | විගණනයට අදාලව අවශ්‍ය තොරතුරු සැපයීමට සමිතිය අපොහොසත් වීම මත විගණනය ප්‍රමාද වී ඇත. එසේම 2013 වර්ෂයන්ට අදාළ ගිණුම් දෙපාර්තමේන්තුව වෙත ලැබී ඇත්තේ 2015 වන අතර 2014 හා 2015 වර්ෂයන්හි ගිණුම් ලැබී ඇත්තේ 2018 වර්ෂයේදීය. මේ අනුව විගණන ප්‍රමාදය සිදුවී ඇති බව පිළිගනිමි. තවද 2013, 2014, හා 2015 වර්ෂයන්ට අදාලව විගණනයන් 2019.06.30 දින වන විට යථාවත්ව ඇත. | සමුපකාර සමිතිවල විගණනයන් නියමිත දිනට නිම කර දායක මුදල් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.2 අරමුදල් ඌන උපයෝජනය

-----------------------------

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුලදී INFOR COOP ව්‍යාපෘතිය සඳහා දෙපාර්තමේන්තුවෙන් ලැබී තිබුණු රු.4,291,000 ක් උපයෝජනය කිරීමෙන් තොරව අරමුදලේ බැරකමක් ලෙස රඳවාගෙන තිබුණි. | ඉදිරියේදී ප්‍රසම්පාදන කටයුතු සඳහා රු.4,291,000 ක මුදල යොදා ගැනීමට බලාපොරොත්තු වන අතර මිලියන 170 ක මූලික පිරිවැයෙන් පලමු වසරට අදාල පිරිවැයට අනුමැතිය ලැබී නොමැති වීම නිසා ව්‍යාපෘති කටයුතු ප්‍රමාද වීමට හේතු වී ඇත. | දෙපාර්තමේන්තුවෙන් ලද මුදල් අදාල කාර්යයට නියමිත කාල සීමාවන් වලදී යෙදවිය යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ බැංකු ජංගම ගිණුමේ සැම මසකම අවසානයේ රු.මිලියන 2 කට වැඩි ශේෂයක් පවත්වාගෙන තිබුණු අතර එම ශේෂයේ වාර්ෂික සාමාන්‍ය රු.8,871,941 ක් විය. ඒ අනුව මාසික වියදම් අවශ්‍යතාවය පුරෝකථනය කර අතිරික්ත මුදල් ආයෝජනය කිරීමට කටයුතු කර නොතිබුණි. | ඇතැම් අවස්ථාවලදී ගෙවීම් කටයුතු වෙනුවෙන් ගිණුමේ මුදල් රඳවාගෙන ඇති අතර අනෙකුත් අවස්ථාවලදී අතිරික්ත මුදල් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කිරීමට කටයුතු කර ඇත. | අතිරික්ත මුදල් ආයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |